ඔබම දැනුවත් කිරීම අපගේ යුතුකමකි

+61 3 9792 9977 info@warnalegal.com




සැමියා සමඟ අවුරුදු 01 කට පෙර සිට දික්කසාදව සිටිමි. මා හට දරුවන් දෙදෙනෙකු සිටින අතර ඔහු අප වෙනුවෙන් කිසිම ගෙවීමක් කර නොමැත. ඔහු සතුව දේපල සහ ආදායම් පවතින බැවින් උසාවියකට යාමකින් තොරව අප හට යම් ගෙවීම් හෝ දේපල ලබා ගත හැකිද?

1. **මා හට අවුරුදු 03 ක රැකවරණ වීසා ලැබී ඇති බැවින් මාගේ පවුලේ ඥාතීන් ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගත හැකිද?**

සංජීව- Hampton Park,Victoria

ඔබ අනවසර සංක්‍රමණිකයෙකු වන බැවින් ඔබට ලැබී ඇත්තේ තාවකාලික රැකවරණ වීසාවකි. මෙම වීසා දරන්නන්ගේ පවුල් වල සාමාජිකයින්ට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමේ පහසුකම් සලසා නැත. නමුත් ඔබට ඔවුන් මුණගැසීමට අවශ්‍ය නම් ගමන් බලපත්‍රයක් (Travel Document) අයදුම් කර ශ්‍රී ලංකාවට ආසන්න රටකට එනම් සිංගප්පූරුව, මැලේසියාව වැනි රටකට ගොස් ඔවුන්වද එහි ගෙන්වාගෙන මුණගැසිය හැකිය.

2. **සැමියා සමඟ අවුරුදු 01 කට පෙර සිට දික්කසාදව සිටිමි. මා හට දරුවන් දෙදෙනෙකු සිටින අතර ඔහු අප වෙනුවෙන් කිසිම ගෙවීමක් කර නොමැත. ඔහු සතුව දේපල සහ ආදායම් පවතින බැවින් උසාවියකට යාමකින් තොරව අප හට යම් ගෙවීම් හෝ දේපල ලබා ගත හැකිද?**

ප්‍රියංගිකා- Sunshine,Victoria

ඔබට උසාවියකට යාමට කැමැත්තක් නොමැති බැවින්, උසාවියකට අයදුම්පතක් යොමු කිරීමෙන් තොරව මූල්‍ය ගිවිසුමකට (Financial Agreement) සැමියා සමඟ එළඹිය හැකිය. මෙහිදී සාකච්ඡා මාර්ගයෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත මෙම ගිවිසුම ඇතිකරගනු ලබන අතර, මෙය සියළුම ඕස්ට්‍රේලියානු රජයේ සහ පෞද්ගලික ආයතන මගින් නීත්‍යානුකූල ලියවිල්ලක් සේ භාරගනු ලැබේ.

3. **මාගේ ව්‍යාපාරය නැවැත්වීමට අදහස් කරන අතර, එම ආපන ශාලාව වෙනත් අයෙකු විසින් කරගෙන යාමට කැමැත්ත පල කර ඇත. මෙම ස්ථානයට අදාල ව්‍යාපාර ස්ථානයේ කුලිය සහ ඊට අදාල කුලී ගිවිසුම් ඔහුට පැවරිය හැකිද?**

වසන්ත- Cranbourne, Victoria

ඔබගේ ව්‍යාපාර ස්ථානය පාලනය කරන ඒජන්ත (State Agent) සමඟ කතාබහ කර, අළුත් ව්‍යාපාරිකයාගේ අයදුම්පත් යොමු කිරීමෙන් ඔබට මෙම කුලී ගිවිසුම් පැවරීමේ සිදු කල හැකිය.(Lease Transfer)

4. **මගේ සහෝදරිය ඕස්ට්‍රේලියාවේ වෙසෙන බැවින් ඇයට අපව; මා හා මගේ පවුලේ සාමාජිකයන් ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගත හැකිද?**

වාසනා-Sri Lanka

ඔබට Visit Visa අයදුම් කිරීමෙන් ඇයව මුණ ගැසීමට සහ ඕස්ට්‍රේලියාවේ සංචාරය කිරීමට හැකිය. ඔබ ස්ථිර පදිංචිය සඳහා කටයුතු කරන්නේ නම් ඔබ නිපුණතා වීසා (Skill Visa) අයදුම් කල විට, ඇයගේ ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය සහ පුරවැසිභාවය සනාථ කර ඔබගේ වීසා අයදුම්පත සඳහා අනුග්‍රහය දැක්විය හැකිය. (Sponsorship)

5. **මා ඉඩම් කට්ටියක් මිළට ගැනීමට මූලික ගෙවීම කර කට්ටිය වෙන් කර ගතිමි.දැන් තැන්පතුව (Deposit) සඳහා මුදල් ගෙවිය යුතු බැවින්,තවමත් ඉඩම් කොටස් වෙන් වෙන් වශයෙන් ලියාපදිංචිව නොමැති බැවින් මුදල් ගෙවීම කොතරම් දුරට විශ්වාසනීයද?**

ප්‍රසාද්- Adelaide

ඔබගේ ගිවිසුම අනුව ඔබ මෙම තැන්පතු මුදල ගෙවිය යුතුය. නමුත් ගෙවනු ලබන්නේ ඒජන්තගේ (State Agent) සේවාදායක ගිණුමට (Trust Account) බව සැක හැර දැනගන්න. ඒ මගින් ඔබට ආරක්ෂාව සැලසේ.

WARNALEGAL
Justice for all
නීති උපකාර | சட்ட சேவைகள்
Need Legal Help? Call us Now
- FAMILY LAW
- AUSTRALIAN LEGAL ADVICE
- MIGRATION LAW
- SRI LANKAN LEGAL ADVICE
- CONVEYANCING
- COMMERCIAL & BUSINESS LAW
- LITIGATION
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS AND COMPANY REGISTRATION SERVICE



Madhu Warnakulasuriya LL.B
Solicitor and Barrister
Registered Migration Agent
(MARN 1068979)
Attorney at Law in Sri Lanka

SWORN TRANSLATIONS • NAATI TRANSLATIONS
03 9792 9977

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1
www.warnalegal.com